# වාර්ෂික කාර්ය සාධන වාර්තාව -2025

# வருடாந்த செயலாற்றுகை அறிக்கை -2025

# Annual Performance Report -2025

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம், நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Department of Census and Statistics, Ministry of Finance, Planning & Economic Development

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංක 252

කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න
අධ්‍යක්ෂ ජනරාල්

2025 ஆம் ஆண்டுக்கான வருடாந்த செயலாற்றுகை அறிக்கை
தொகைமதிப்பு, புள்ளிவிபரத் திணைக்களம்
செலவின தலைப்பு இல.252

கே.எம்.டீ.எஸ்.டீ. கருணாரத்ன
பணிப்பாளர் நாயகம்

Annual Performance Report for 2025
Department of Census and Statistics
Expenditure Head No. 252

K.M.D.S.D. Karunaratne
Director General

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ නිල සංඛ්‍යාති පිළියෙල කරනු ලබන ප්‍රධාන ආයතනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ විවිධ සංගණන, සමීක්ෂණ පැවැත්වීමෙන් සහ පරිපාලන වාර්තා මඟින් දත්ත රැස්කිරීම, සැකසුම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ දත්ත ප්‍රචලිත කිරීම වේ.

මෙම දත්ත සහ දර්ශකාංක රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට, ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට, පවත්නා වැඩසටහන් ඇගයීමට සහ රටේ ආර්ථික, සමාජයීය වශයෙන් කාලීනව සිදුවන වෙනස්කම් අධ්‍යයනය කිරීමට යොදා ගනී. එමෙන්ම, රටේ එක් එක් ප්‍රදේශයන්හි ප්‍රජා විද්‍යාත්මක සමාජීය සහ ආර්ථික තත්ත්වයන් අතර පවත්නා සමාන, අසමානකම් අධ්‍යයනය කිරීමට සහ එම අසමානකම් අවම කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් සකස් කිරීමට සහ රටවල් අතර, ආර්ථික හා සමාජීය තොරතුරු සංසන්දනය කිරීමට යොදා ගැනේ. මෙයට අමතරව, පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, මාධ්‍ය ආයතන හා විවිධ පුද්ගලයින් විසින් විවිධ අවශ්‍යතා සඳහා මෙම දත්ත භාවිතා කරනු ලබයි. දත්ත රැස් කිරීම, සැකසුම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ දත්ත ප්‍රචලිත කිරීමට අදාළ සියලුම කටයුතු ජාත්‍යන්තරව පිළිගත් සංඛ්‍යාලේඛන ක්‍රමවේදයන් මාර්ගෝපදේශ අනුගමනය කරමින් සංඛ්‍යාලේඛන හා සංගණන ආඥා පනත්වලට යටත්ව සිදුකරනු ලබයි.

නිල සංඛ්‍යාති පිළියෙල කිරීමට අමතරව, සංඛ්‍යාන සේවය අවශ්‍ය වන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංඛ්‍යාන උපදෙස් සේවාව ලබාදීම සහ විශේෂ සමීක්ෂණ පැවැත්වීමද දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි.

2025 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තූතිය පුද කරන අතර, දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන කාර්යයන් සඳහා දත්ත ලබාදීම මඟින් සහ නන් අයුරින් සහයෝගය ලබා දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන සහ මහජනතාවට මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරමි.




කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල.
2026 ජුනි
දුරකථන අංකය: +94 11 2147001
ෆැක්ස්: +94 11 2147011
විද්‍යුත් ලිපිනය: dgcensus@statistics.gov.lk
වෙබ් අඩවිය: www.statistics.gov.lk

## பணிப்பாளர் நாயகத்தின் செய்தி

இலங்கையில் உத்தியோகபூர்வ புள்ளிவிபரங்களை தொகுப்பதற்கான பிரதான நிறுவனம் தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களமாகும். இத்திணைக்களத்தின் முக்கிய பணிகள் பல்வேறு தொகைமதிப்புகள், அளவீடுகள் மற்றும் முகாமைத்துவ அறிக்கைகள் மூலம் தரவுகளை சேகரித்தல், தொகுத்தல், பகுப்பாய்வு செய்தல் மற்றும் பரப்புதல் ஆகும்.

இத்தரவுகள் மற்றும் குறிகாட்டிகள் அரசாங்கக் கொள்கைகளை உருவாக்குவதற்கும், எதிர்கால அபிவிருத்தித் திட்டங்களை திட்டமிடுவதற்கும், நடைமுறையில் உள்ள திட்டங்களை மதிப்பீடு செய்வதற்கும், மேலும் நாட்டில் காலப்போக்கில் நிகழும் சமூக-பொருளாதார மாற்றங்களை ஆய்வு செய்வதற்கும் பயன்படுத்தப்படுகின்றன. அதேபோல், நாட்டின் ஒவ்வொரு பிராந்தியத்திலும் உள்ள சனத்தொகை மற்றும் சமூக-பொருளாதார நிலைமைகளின் ஒற்றுமைகள் மற்றும் வேறுபாடுகளை ஆய்வு செய்வதற்கும், அவ் வேறுபாடுகளை குறைப்பதற்கான தேவையான திட்டங்களை உருவாக்குவதற்கும், மேலும் நாடுகளுக்கிடையிலான பொருளாதார மற்றும் சமூகத் தரவுகளை ஒப்பிடுவதற்கும் இத்தரவுகள் பயன்படுகின்றன. மேலும், ஆராய்ச்சி நிறுவனங்கள், கல்வி நிறுவனங்கள், ஊடக நிறுவனங்கள் மற்றும் பல்வேறு நபர்கள் பல்வேறு நோக்கங்களுக்காக இத்தரவுகளை பயன்படுத்துகின்றனர். தரவுச் சேகரிப்பு, தொகுத்தல், பகுப்பாய்வு மற்றும் பரப்புதல் தொடர்பான அனைத்து நடவடிக்கைகளும் புள்ளிவிபர மற்றும் தொகைமதிப்பு சட்டங்களின் கீழ், சர்வதேச ரீதியாக ஏற்றுக்கொள்ளப்பட்ட முறைமைகள் மற்றும் வழிகாட்டுதல்களைப் பின்பற்றி மேற்கொள்ளப்படுகின்றன.

திணைக்களத்தின் புள்ளிவிபரப் பொறுப்புகளுக்கு மேலாக, அரசு மற்றும் அரசல்லாத நிறுவனங்களுக்கு தேவையான புள்ளிவிபர ஆதரவை வழங்கும் வகையில் பயிற்சி திட்டங்கள், புள்ளிவிபர ஆலோசனை சேவைகள் மற்றும் சிறப்பு அளவீடுகளும் மேற்கொள்ளப்படுகின்றன.

2025 ஆம் ஆண்டில் எமது இலக்குகளை அடைவதில் அர்ப்பணிப்புடன் செயல்பட்ட திணைக்களத்தின் ஊழியர்களின் பொறுப்புணர்வு மற்றும் உறுதியான முயற்சிகளுக்கு எனது மனப்பூர்வமான நன்றியை தெரிவித்துக்கொள்கிறேன். அதேபோல், திணைக்களத்தின் புள்ளிவிபர முயற்சிகளுக்கு பெறுமதிமிக்க தகவல்களை வழங்கியதுடன் தொடர்ந்தும் ஒத்துழைப்பு வழங்கிய அரசாங்கம், தனியார் துறை நிறுவனங்கள், பிற அமைப்புகள் மற்றும் பொதுமக்களுக்கு எனது மனப்பூர்வமான நன்றியை தெரிவித்துக்கொள்கிறேன்.



கே.எம்.டீ.எஸ்.கருணாரத்ன
பணிப்பாளர் நாயகம்
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
“சங்கியான மந்திரய”
இல.306/71, பொல்துவ வீதி,
பத்தரமுல்லை.
ஜூன் 2026
தொலைபேசி இல: +94 11 2147001
தொலைநகல்: +94 11 2147011
மின்னஞ்சல்: dgcensus@statistics.gov.lk
வலையமைப்பு : www.statistics.gov.lk

## MESSAGE FROM THE DIRECTOR GENERAL

The Department of Census and Statistics serves as the principal institution responsible for producing official statistics in Sri Lanka. Its core functions include the collection, processing, analysis and dissemination of data through various censuses, surveys and administrative reports.

These data and indicators are used to formulate government policies, plan future development programs, evaluate ongoing programms, and study the socio-economic changes taking place over time in the country. Similarly, they are used to study the similarities and differences between demographic and socio-economic conditions of each region of the country, to formulate necessary programs to minimize those disparaties, and to compare economic and social information between countries. In addition, this data is used by research institutions, educational institutions, media institutions and various individuals for various purposes. All activities related to the data collection, processing, analysis and dissemination of data are carried out in accordance with the statistics and census ordinanaces, following internationally accepted methodologies and guidelines.

In addition to its statistical responsibilities, the Department also conducts training programs, offers statistical advisory services, and carries out specialized surveys for government and non- governmental organizations that require statistical support.

I extend my heartfelt appreciation to the dedicated staff of the Department, whose responsible and committed efforts have been instrumental in achieving our objectives for the year 2025. I also wish to convey my sincere gratitude to the government, private sector institutions, other organizations, and members of the public who have extended their unwavering support to the Department,by providing their information for national statistical endeavors.

K.M.D.S.D. Karunaratne
Director General
Department of Census and Statistics
"Sankyana Mandiraya"
No: 306/71, Polduwa Road,
Battaramulla.
June 2026
Tele.No. +94 11 2147001
Fax : +94 11 2147011
Email address: dgcensus@statistics.gov.lk
Website : www.statistics.gov.lk

## අන්තර්ගතය

පිටු අංක


| | |
|---|---|
| පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 7-11 |
| පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 12-14 |
| පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය | 15-26 |
| පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක | 27-43 |
| පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය | 44-47 |
| පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ | 48-57 |
| පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව | 58-66 |
| | |
| அத்தியாயம் 01 – நிறுவனத்தின் விவரம் /நிறைவேற்றுப் பொழிப்பு | 67-72 |
| அத்தியாயம் 02 – முன்னேற்றம் மற்றும் எதிர்கால கண்ணோட்டம் | 73-74 |
| அத்தியாயம் 03 – வருடத்திற்கான ஒட்டுமொத்த நிதிச் செயலாற்றுகை | 75-86 |
| அத்தியாயம் 04 – செயலாற்றுகை குறிகாட்டிகள் | 87-104 |
| அத்தியாயம் 05 – நிலைபேறான அபிவிருத்தி இலக்குகளை (SDG) அடையும் செயலாற்றுகை | 105-107 |
| அத்தியாயம் 06 – மனித வள விபரம் | 108-116 |
| அத்தியாயம் 07 – இணக்க அறிக்கை | 117-127 |
| | |
| Chapter 01 - Institutional Profile/Execution Summary | 128-132 |
| Chapter 02 - Progress and the Future Outlook | 133-135 |
| Chapter 03 - Financial Performance of the year | 136-146 |
| Chapter 04 - Performance indicators | 147-164 |
| Chapter 05 - Performance of achieving Sustainable Development Goals (SGD) | 165-167 |
| Chapter 06 - Human Resource Profile | 168-177 |
| Chapter 07 - Compliance Report | 178-187 |

# පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ ජාතික මට්ටමේ සංගණන, සමීක්ෂණ, සහ පරිපාලන වාර්තාවන් පදනම්ව දත්ත රැස්කිරීම, සැකසුම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ දත්ත ප්‍රකාශයට පත් කිරීම වේ. මෙසේ රැස් කරනු ලබන දත්ත සහ පිළියෙල කරනු ලබන විවිධ දර්ශකාංක ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට, ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට, සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීමට භාවිතා කෙරේ. එමෙන්ම, රට තුළ විවිධ භූගෝලීය කලාපයන්හි ප්‍රජා විද්‍යාත්මක, ආර්ථික හා සමාජීය තත්ත්වයන් අතර පවත්නා විෂමතාවන් හඳුනාගැනීමටත්, එම විශ්ලේෂණයන් පදනම්ව එම අසමානකම් අවම කිරීමට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට මෙන්ම අනෙකුත් රටවල් සමග සිදු කෙරෙන සමාජ ආර්ථික සංසන්දනයන් සඳහාත් මෙම නිල සංඛ්‍යාති භාවිතා කෙරේ. මෙයට අමතරව, අධ්‍යාපන ආයතන, පර්යේෂකයන්, මාධ්‍ය ආයතන ආදි විවිධ ආයතන සහ පුද්ගලයන් විසින් පර්යේෂණ හා අධ්‍යයන අවශ්‍යතා සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර ප්‍රකාශයට පත් කරනු ලබන දත්ත භාවිතා කරනු ලබයි.

1900 අංක 9 දරන සංගණන ආඥා පනත, සහ 1935 අංක 44 දරන සංඛ්‍යාලේඛන ආඥා පනත් මගින් මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙන්ම, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුගත වෙමින් මෙම දත්ත රැස්කිරීම්, දත්ත සැකසුම් කාර්යයන්, දත්ත විශ්ලේෂණයන් මෙන්ම දත්ත ප්‍රකාශයට පත් කිරීමද සිදු කරනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබාදීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

### මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

### 1.3 ප්‍රධාන කාර්යයන්

1. දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සංගණන සහ සමීක්ෂණ

- 2024 ජන හා නිවාස සංගණනයේදී, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංගණන ඉතිහාසයේ ප්‍රථම වරට ටැබ්ලට් පරිගණක සහ සුහුරු ජංගම දූරකථන උපයෝගී කර ගනිමින් සම්මුඛ සාකච්ඡා මඟින් (CAPI - Computer Assisted Personal Interviewing) තොරතුරු රැස් කරන ලද අතර, මුද්‍රිත ප්‍රශ්නාවලියකින් බැහැරව සංගණනයක් පවත්වන ලද පළමු අවස්ථාව ද මෙය විය. එයට අමතරව අන්තර්ජාලය මඟින් තොරතුරු රැස් කිරීමද (ඉ-සංගණනය) (CAWI-Computer Assisted Web Interviewing) සිදු කෙරුණි. එසේ වුවද, CAPI ක්‍රමවේදය භාවිත කළ නොහැකි ඇතැම් අවස්ථාවලදී පමණක් මුද්‍රිත ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් ඉතා සුළු ඒකක ප්‍රමාණයක තොරතුරු රැස් කිරීම සිදු කරන ලදී. ඒ අනුව 2024 සංගණනයේදී, තොරතුරු රැස් කිරීමට ගත වූ කාලය, පිරිවැය සහ කඩදාසි භාවිතය අවම කිරීමට මෙවර සංගණනය සිදු කිරීමේදී දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණි.

- ඒ අනුව, සංගණනයේ මූලික තොරතුරු ඇතුලත් වාර්තාව 2025 මැයි මස රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වන අතිගරු ජනාධිපතිතුමා වෙත පිරිනමන ලදි. එම වාර්තාව මඟින් රටේ සමස්ත ජනගහන තොරතුරු දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රකාශයට පත් කිරීම සිදු කෙරුණි.

- දෙවන අදියරේදි අවසාන දත්ත ඇසුරින් සකස් කරන ලද ජනගහන හා නිවාස තොරතුරු ඇතුලත් වාර්තා දෙකක් ඔක්තෝබර් මාසයේදී ප්‍රකාශයට පත් කළ අතර, ඒ හා සමගාමීව තෝරාගත් ජනගහන හා නිවාස තොරතුරු සඳහා කුඩාම පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් දත්ත වගු සහ සිතියම් කිහිපයක්ද ප්‍රකාශයට පත් කෙරුණි.

2. ආර්ථික සංගණනය -2025/26 (කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු) පිළිබඳ තොරතුරු රැස් කිරීමේ සංගණනය පැවැත්වීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කිරීම, ප්‍රශ්නාවලින් සැකසීම සහ ආර්ථික සංගණනය -2025/26 (කෘෂිකාර්මික කටයුතු) පිළිබඳ තොරතුරු රැස්කිරීමට අදාලව සංගණන කොමසාරිස් වරුන්, නියෝජ්‍ය කොමසාරිස් වරුන් දැනුවත් කිරීම සිදු කරන ලදී .එමෙන්ම අදාළ පරිගණක වැඩසටහන් සහ ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමට අදාළ පරිගණක පද්ධති සකස් කිරීමද සිදු කරන ලදී. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ගණන් ගන්නා නිලධාරින් පුහුණු කිරීමේ කටයුතුද අවසාන කිරීමට ආසන්නව පැවති නමුත් වසර අවසානයේ ඇතිවූ දිට්වා ආපදා තත්ත්වය තුළ මෙම සංගණනයේ ක්ෂේත්‍ර කටයුතු කල් දැමීමට සිදු විය.

3. සමාජ, ආර්ථික දත්ත එක් රැස් කර සාර්ව ආර්ථික දර්ශක සකස් කිරිම සහ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කළ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු.

- ශ්‍රී ලංකාව සඳහා දළ දේශිය නිෂ්පාදිතය, ආර්ථික වර්ධන වේගය, උද්ධමනය හා මිල දර්ශකයන් ඇතුළු සාර්ව ආර්ථික දර්ශක සකස් කිරිම හා ප්‍රකාශයට පත් කිරීම මෙන්ම රටේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට අදාල දර්ශක සකස් කිරීම.

4. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මඟින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු .

- අදාල ආයතනයේ දත්ත අවශ්‍යතා සපුරාලීම සඳහා සංගණන, සමීක්ෂණ හා අනෙකුත් දත්ත රැස්කිරීම් සිදුකර ඇති අතර ඒ අනුව අදාල සංඛ්‍යාති සකස් කිරීමට කටයුතු කිරීම. මෙම වාර්තා සියල්ලම සිංහල, දෙමළ, ඉංග්‍රිසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදි.

5. දේශීය හා විදේශීය දත්ත භාවිතා කරන්නන්ගේ දත්ත ඉල්ලීම් වලට අනුව අවශ්‍ය දත්ත සකස් කර ලබා දීමේ කටයුතු.

- මෙහි දී දෙපාර්තමේන්තුව විවිධ සංගණන හා සමීක්ෂණ මඟින් රැස් කර ඇති සංඛ්‍යානමය තොරතුරු

### 1.4 සංවිධාන සටහන (ඇමුණුම 01)

මෙම දෙපාර්තමේන්තුව බත්තරමුල්ල, පොල්දූව පාරේ පිහිටි ප්‍රධාන කාර්යාලයකින් හා දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා පළාත් සභා වල පිහිටි සංඛ්‍යාලේඛන අංශ සමූහයකින්ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අනුයුක්ත සංඛ්‍යාලේඛන නිලධාරීන්ගෙන් ද සමන්විත වේ.

### ප්‍රධාන කාර්යාලයේ අංශ හා ඒකක

ප්‍රධාන කාර්යාලයේ පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15ක් සහ විශේෂ ඒකක 03ක් මඟින් 2025 වසර තුළ අදාළ කාර්යයන් මෙහෙයවන ලදි. ප්‍රධාන කාර්යාලය අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වන අතර එම අංශය මඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු විගණනය කර ගැටළු සහිත අවස්ථා පෙන්වා දෙමින්, සහ ඒවා නිරාකරණය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙමින් අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.

#### තාක්ෂණික අංශ

| | |
|---|---|
| 1 වන අංශය | ජන සංගණන හා ප්‍රජා විද්‍යා |
| 2 වන අංශය | කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා |
| 3 වන අංශය | කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාති |
| 4 වන අංශය | ජාතික ගිණුම් |
| 5 වන අංශය | ප්‍රකාශන |
| 6 වන අංශය | පුස්තකාල හා ප්‍රලේඛන |
| 7 වන අංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |
| 8 වන අංශය | ආයතනික හා ගිණුම් |
| 9 වන අංශය | නියැදි සමීක්ෂණ |
| 10 වන අංශය | මුද්‍රණ |
| 11 වන අංශය | ක්ෂේත්‍ර කළමනාකරණ |
| 12 වන අංශය | පුහුණු |
| 15 වන අංශය | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන |
| 16 වන අංශය | මිල හා වේතන |
| 18 වන අංශය | සිතියම් විද්‍යා |

**විශේෂ ඒකක**

- දත්ත නිකුත් කිරීමේ ඒකකය
- සංඛ්‍යාන සංවර්ධනය හා ජාත්‍යන්තර සහයෝගිතා ඒකකය
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ඒකකය

**දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල**

බත්තරමුල්ල පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් සභා කාර්යාලවල, දෙපාර්තමේන්තුවට අයත් සංඛ්‍යාලේඛන අංශ පිහිටුවා ඇති අතර දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 340ට අනුයුක්තව සංඛ්‍යාලේඛන නිලධාරීන් හෝ එම නිලධාරීන්ගේ දත්ත රැස්කිරීමේ රාජකාරි ආවරණය කරන සංවර්ධන නිලධාරින් හෝ වෙනත් නිලධාරින් සේවය කරයි.

මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටි සංඛ්‍යාලේඛන අංශ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/සංඛ්‍යාලේඛනඥවරයකු යටතේ පවත්නා අතර එම නිලධාරියාට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛන සහකාරවරුන්, සංවර්ධන නිලධාරිවරුන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් කිහිපදෙනෙක් අනුයුක්ත කොට ඇත. එක් එක් දිස්ත්‍රික්ක තුළ, දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන හා අනෙකුත් දත්ත රැස්කිරීමේ කටයුතු මෙම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ හා ප්‍රධාන කාර්යාලය අතර සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේ ද මෙම දිස්ත්‍රික් කාර්යාල මඟිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන නිලධාරි හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේ දත්ත රැස්කිරීම සිදු කරයි.

මීට අමතරව විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ තුළ සංඛ්‍යාලේඛන අංශයක් ස්ථාපිත කර සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධරයකු අනුයුක්ත කර ඇති අතර දිවයින පුරා මෙවැනි ආයතන 57 ක් පවතී. මෙම සංඛ්‍යාලේඛන අංශ, අධ්‍යක්ෂ (සංඛ්‍යාන)/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) / සංඛ්‍යාලේඛනඥ /සංඛ්‍යාලේඛන නිලධාරිවරයකු යටතේ පවතී. සංඛ්‍යාලේඛන අංශය පිහිටි ආයතනයේ රාජකාරි සඳහා අවශ්‍ය සංඛ්‍යාලේඛන රැස්කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත්කිරීම මෙම ශාඛා කාර්යාල මඟින් සිදුවේ. ප්‍රධාන කාර්යාලය හා අදාළ ආයතන අතර සංඛ්‍යාලේඛන කටයුතු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කළමනාකරණ අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලබයි.

**1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

අදාළ නැත

**1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්**

අදාළ නැත

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රු. 000

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | වැය විෂය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| UNFPA වාර්ෂික වැඩ සැලැස්ම | UNFPA | 252-1-1-29-2509 (13) | 500,000 | 2025 ජනවාරි - 2025 දෙසැම්බර් |
| ආසියා පැසිෆික් කලාපීය ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන | ADB | 252-1-05-2507(13) | 10,535 | 2024 පෙබරවාරි-2026 දෙසැම්බර් |
| ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය | WFP/WHO/UNDP | 252-1-1-28-2507 (13) | 15,449 | 2023 ජනවාරි - 2025 ජූනි |

**වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් කරන ලද විදේශ ආධාර ලබන ව්‍යාපෘති**

රු.

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | වැය විෂය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|
| නැත | | | | |

## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක**

**පසුගිය වසර තුල දෙපාර්තමේන්තුව ලැබූ විශේෂ ජයග්‍රහණ රාශියකි. ඒවා පහත දැක්වේ.**

- තිරසාර සංවර්ධන දර්ශක (SDG) කිහිපයක් අලුතින් ගණනය කිරීමට හැකිවීම හා තවත් දර්ශක කිහිපයක් ගණනය කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි කිහිපයක් (Modules) දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන සමීක්ෂණ වලට එකතු කර ක්ෂේත්‍රයේ අදාළ දත්ත රැස්කිරීම සිදු කිරීම.

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දත්ත රැස් කිරීමේ කාර්යයක් වන වසර 10කට වරක් සිදු කරන ජන හා නිවාස සංගණනය - 2024 සඳහා මුල් වරට නව තාක්ෂණය භාවිතා කරමින් ටැබ්ලට් පරිගණක හා සුහුරු ජංගම දුරකථන භාවිතයෙන් සාර්ථකව සිදුකර අවසන් කිරීමට හැකිවීම.

- ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය, ආර්ථික වර්ධන වේගය, උද්ධමනය හා මිල දර්ශක ඇතුළු අනෙකුත් සංඛ්‍යාතීන් ඉදිරි දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත්කිරීම.

- දෙපාර්තමේන්තුව මඟින් දත්ත ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම හා සමාජ මාධ්‍ය භාවිතය ඇතුළු ක්‍රමවේද හරහා නිල සංඛ්‍යාති පිළිබඳව මෙන්ම භාවිතා කරනු ලබන සංකල්ප හා අර්ථ දැක්වීම් පිළිබඳව ද දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරීමට පියවර ගැනිම.

- විවිධ පුද්ගලික සහ ආයතනික ක්ෂුද්‍ර දත්ත ගොනු ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් (අධ්‍යාපනය ලබන ප්‍රජාවගේ හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වන ආයතනවල ක්ෂුද්‍ර දත්ත ඉල්ලීම් හැර) රු.මිලියන 5.46 ක පමණ ආදායමක් උපයා ගැනීමට හැකිවීම සහ මෙම අදායමෙන් 65% ක් පමණ මුදලක් විදේශ මුදල් ලෙස උපයා ගැනීමට හැකිවීම.

- සංඛ්‍යාලේඛන නිලධාරී හා සංඛ්‍යාලේඛනඥ තනතුරුවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවත්වීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ හා සංඛ්‍යාලේඛන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සංශෝධනය කිරීම.

- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා උසස්වීම් ලබා දීම .

- දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු සඳහා (විධායක, මාණ්ඩලික මට්ටමේ) පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාලව 2024.12.31 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාවන් සඳහා අදාල අනුමැතීන් ලබා ගැනීම.

- සියලුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන සංවර්ධනය සඳහා උපායමාර්ගික සැලැස්ම කෙටුම්පත් කිරීම.

- 1900 අංක 9 දරණ සංගණන ආඥා පනත හා 1935 අංක 44 දරණ සංඛ්‍යාලේඛන ආඥා පනත ඒකාබද්ධ කර නව ජාතික සංඛ්‍යාන පනත සකස් කිරීමට අදාල මූලික කෙටුම්පත ජාත්‍යන්තර මාර්ගෝපදේශකයන්ට අනුකූල වෙමින් පිළියෙළ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හා පනත කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- ජන හා නිවාස සංගණනයේ මූලික වාර්තාව 2025.03.24 දින නිකුත් කිරීම හා දිස්ත්‍රික් මට්ටමේ මූලික ජනගහන තොරතුරු හා මූලික නිවාස තොරතුරු ඇතුලත් වාර්තාවන් දෙකක් 2025.10.30 දින ප්‍රකාශයට පත් කිරීම.

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දත්ත රැස් කිරීමේ කාර්යයක් වන වසර 10කට වරක් සිදු කරන ජන හා නිවාස සංගණනය - 2024 සඳහා මුල් වරට නව තාක්ෂණය භාවිතා කරමින් ටැබ්ලට් පරිගණක හා සුහුරු ජංගම දුරකථන භාවිතයෙන් සාර්ථකව සිදුකර අවසන් කිරීමට හැකිවීම.

- සංගණනයේ ප්‍රධාන අදියරක් වන සංගණන කාණ්ඩ සඳහා සිතියම් සකස් කිරීමේදී සමස්ත දිවයිනම සඳහා නව තාක්ෂණය භාවිතයෙන් ඩිජිටල් සිතියම් සකස් කිරීමට හැකිවීම හා එම සිතියම් භාවිතයෙන් විවිධ භූගෝලීය මට්ටම් සඳහා සංගණන දත්ත ප්‍රකාශයට පත්කිරීමට හැකිවීම.

**දෙපාර්තමේන්තුවේ අදාළ කටයුතු සිදු කිරීමේ දී මුහුණදීමට සිදුවූ අභියෝග කිහිපයකි.**

- තාක්ෂණික හා අනෙකුත් සහායක සේවාවන්හි තනතුරුවල පුරප්පාඩු තව දුරටත් එසේම පැවතීම හා නිලධාරීන් විශ්‍රාමයාම හෝ නිවාඩු ලබා ගැනීම හේතුවෙන් පුරප්පාඩු ප්‍රමාණය තවදුරටත් ඉහල යාම. දෙපාර්තමේන්තුවේ දැනට පවතින නිලධාරි හිඟය මධ්‍යයේ අනෙකුත් සමීක්ෂණ සඳහා තොරතුරු රැස් කිරීම් වලට බාධාවක් නොවන පරිදී ජන හා නිවාස සංගණනයේ කටයුතු සිදු කිරීම.

- දෙපාර්තමේන්තුවේ දැනට පවතින නිලධාරී හිඟය යටතේ සියළුම නිල සංඛ්‍යාති සකස් කිරීමේ කටයුතු නියමිත කාල වකවානු තුල සිදු කිරීම.

- සංඛ්‍යාලේඛන ක්ෂේත්‍රයේ සිදුවන දියුණුවීම් සහ වෙනස්කම් වලට අනුකූල වන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම.

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දිර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් ආර්ථික සංගණනය (කෘෂි කාර්මික කටයුතු) ප්‍රසම්පාදන අවසන් කර ගත නොහැකි වීම.

- දෙපාර්තමේන්තුව තුළ පවත්නා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී හිඟය සහ ධාරිතාවන් හි ඇති ගැටළු ඉතා සංකීර්ණ වූ ආර්ථික සංගණනය (කෘෂි කාර්මික කටයුතු) ප්‍රශ්නාවලියේ CAPI වැඩසටහන සකස් කිරීම සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට සිදුවීම.

- වසර 10 කට වරක් පැවැත්වෙන සංගණන, ආපසු නොගෙවන විදේශීය අරමුදල් භාවිතයෙන් අන්තර්ජාතිකව සිදුකරන විශේෂිත සමීක්ෂණ ශ්‍රී ලංකාව සඳහා සිදු කිරීමේදී අදාල නිලධාරි ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම.

**දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළව මුහුණ දීමට සිදුවන අභියෝග ජයගනිමින් පහත සඳහන් ඉදිරි ඉලක්ක කරා ළඟාවීමට අප බලාපොරොත්තු වේ.**

- සියලුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන සංවර්ධනය සඳහා වන උපාය මාර්ග සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හා එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

- ජාතික සංඛ්‍යාන පද්ධතිය සඳහා වන නීති රාමුව සම්මත කරවා ගැනීම.

- ආර්ථික සංගණනය -2025/26 (කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු) සිදුකිරීමට අදාල කටයුතු සිදුකිරීම.

- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිය පිළිබඳ සංගණනයේ අවසන් වාර්තාව නිකුත් කිරීම.

- ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍යය සමීක්ෂණය-2025 සිදුකිරීමට කටයුතු කිරීම හා හඳුනාගත් විශේෂිත සමීක්ෂණ සඳහා පූර්ව පරීක්ෂා සිදුකිරීමට කටයුතු කිරීම.

- සංඛ්‍යාලේඛන ක්ෂේත්‍රයේ සිදුවන දියුණුවීම් සහ වෙනස්කම් වලට අනුකූල වන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම.

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විෂය විශේෂඥයකු ලෙස සහභාගි විය යුතු සියලු ජාතික /ආයතනික මට්ටමේ කමිටු සඳහා දායකත්වය ලබා දෙමින් එම කාර්යයන් සාර්ථක කිරීම සඳහා සහයෝගය ලබාදීම.

දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාලව මුහුණ දීමට සිදුවන අභියෝග ජය ගනිමින් ඉදිරි ඉලක්ක කරා ළඟාවීමට අප බලාපොරොත්තු වේ.

# පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | සත්‍ය 2025 | සත්‍ය 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,397,626,492 | 1,294,832,786 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 8,615,295 | 18,071,086 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 49,496,980 | 46,593,897 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,455,738,767** | **1,359,497,769** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,455,738,767** | **1,359,497,769** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | **3,046,062** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,455,738,767** | **1,356,451,707** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 1,165,015,333 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,165,015,333 | 1,023,999,207 | ඒසීඒ-2(ii) |
| 239,910,580 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 239,910,580 | 244,741,206 | ඒසීඒ-2(ii) |
| 7,322,121 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම | 7 | 7,322,121 | 8,450,707 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | 190,840 | ඒසීඒ-2(ii) |
| 1,412,248,034 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,412,248,034** | **1,277,381,960** | |
| | **මූලධන වියදම්** | | | | |
| 29,354,973 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 29,354,973 | 20,543,610 | ඒසීඒ-2(ii) |
| 4,781,243 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 4,781,243 | 5,855,147 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | 0 | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 0 | - | ඒසීඒ-2(ii) |
| 3,862,664 | හැකියා වර්ධනය | 14 | 3,862,664 | 3,099,074 | ඒසීඒ-2(ii) |
| 1,246,464,443 | වෙනත් මූලධන වියදම් | 15 | 1,246,464,443 | 923,782,095 | ඒසීඒ-2(ii) |
| 1,284,463,323 | **මුළු මූලධන වියදම් (උ)** | | **1,284,463,323** | **953,279,926** | |
| | තැන්පතු ගෙවීම් | | 8,867,959 | 23,123,838 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 68,151,414 | 47,000,508 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 0 | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **77,019,373** | **70,124,346** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **2,773,730,730** | **2,300,786,232** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(1,317,991,963)** | **(944,334,525)** | |
| | **අග්‍රිම කැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(1,317,991,963)** | **(944,334,525)** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **0** | **0** | ඒසීඒ-3 |
| | | | **(1,317,991,963)** | **(944,334,525)** | |

-

## 3.3 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තතා 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 3,821,241,385 | 3,791,286,071 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 128,657,459 | 110,003,025 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **3,949,898,844** | **3,901,289,096** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 126,056,040 | 107,148,943 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 3,821,241,385 | 3,791,286,071 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ-5(බි) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසිඒ-4 | 2,601,419 | 2,854,082 |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **3,949,898,844** | **3,901,289,096** |

පිටු අංක..28....සිට 34.... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..35..... සිට 47..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | K H D S D Karunaratne | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2026/2/19 |
| දිනය : 2026.02.27 | | |

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,
ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති
ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

කේ.එච්.ඩී.එස්.ඩී. කරුණාරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දුව පාර,

2

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2025<br>රු. | සංශෝධිත<br>2024<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 73,621,010 | 84,951,801 |
| අග්‍රිම ලැබීම් | | 1,397,626,492 | 1,294,832,786 |
| අත්තිකාරම් අයකර ගැනීම | | 48,246,927 | 44,714,187 |
| තැන්පතු ලැබීම් | | 8,615,295 | 18,071,086 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **1,528,109,724** | **1,442,569,860** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 1,340,379,691 | 1,221,747,509 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 7,322,121 | 8,450,707 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | | 95,803,271 | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 3,885,741 | 8,390,527 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | 3,046,061 |
| අත්තිකාරම් ගෙවීම් | | 68,151,414 | 46,709,558 |
| තැන්පතු ගෙවීම් | | 8,867,959 | 23,123,838 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **1,524,410,197** | **1,311,468,200** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **3,699,527** | **131,101,660** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | | |
| මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | | 3,699,527 | 131,101,660 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **3,699,527** | **131,101,660** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(3,699,527)** | **(131,101,660)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම | | - | - |
| විදේශීය ණය ගැනීම | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | | | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

### 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තා කිරීමේ පදනම**

**1. පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**2. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**3. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**4. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**5. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**6. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**7. මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

**3.6** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය **(අප දෙපාර්තමේන්තුවට අදාල නොවේ)**

රු.

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදයම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | | | | | |

**3.7** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදනය | | සත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,332,000 | 1,475,063 | 1,412,248 | 95.74 |
| ප්‍රාග්ධන | 1,872,500 | 2,220,893 | 1,284,463 | 57.84 |

**3.8** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය හෝ | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | මැතිවරණ කොමිෂන් සභාව | පාර්ලිමෙන්තු මැතිවරණය 2024.11.14 / පළාත් පාලන ආයතන ජන්ද විමසීම -2025.05.06 කාර්ය මණ්ඩල දිමනා | 2,970,867.00 | 2,970,867.00 | 2,956,717.00 | 99.52 |

**3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය** **රු.000**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | 31.12.2025දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,184,910 | 1,184,910 | නැත | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 1,443,812 | 1,443,812 | | |
| 9153 | ඉඩම් | 1,186,900 | 1,186,810 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 5,618 | 5,618 | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.10 විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/D/DCS/FA/2025/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

ගණන්දීමේ නිලධාරී
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම

විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

**(අ) ප්‍රතිපාදන උපයෝජනය**

මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වර්ෂයේ වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, පුනරාවර්තන වැය විෂයන් 01ක සහ මූලධන වැය විෂයන් 07ක ශුද්ධ ප්‍රතිපාදනයන්ගේ ඉතිරිය සියයට 19 – 100 අතර වන බව නිරීක්ෂණය විය.

### 3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

(අ) 2025 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු වසර 1ට අඩු එකතුව රු.614,510ක් වූ ණය ශේෂය, විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.196,630 ක් වූ වසර 1ට වැඩි ණය ශේෂය සහ 2025 මැයි 30 දින වැඩ තහනම් කර ඇති නිලධාරියකුගෙන් අය විය යුතු රු.181,300ක් වූ ණය ශේෂය අයකර ගැනීමට මෙම වාර්තාවේ දිනය තෙක් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු වසර 8කට වැඩි එකතුව රු.259,174ක් වූ ණය ශේෂය සහ වසර 1-3ත් අතර කාලයක් අය නොවී පවතින එකතුව රු.174,480ක් වූ ණය ශේෂය වාර්තාවේ දිනය තෙක් අයකර ගෙන නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව පිළිබඳ පරීක්ෂාවේදී, දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් 14කට අදාලව අපේක්ෂිත නිමවුම් මට්ටම්වල ප්‍රගතිය සියයට 5ත් සියයට 65ත් අතර පැවති බව නිරීක්ෂණය විය.

### 4.2 වත්කම් කළමනාකරණය

(අ) ජන හා නිවාස සංගණනයේ කටයුතු සඳහා 2023 වර්ෂයේදී රු.685,821,178ක් ගෙවා මිලදී ගත් ටැබලට් පරිගණක 15,000 ට අදාලව 2025 දෙසැම්බර් 31 දිනට පැවති තත්වය පිළිබඳ පරීක්ෂාවේදී අස්ථානගත වී ඇති ටැබ් පරිගණක 19ක් සම්බන්ධයෙන් සිදුවී ඇති අලාභය රු.868,699ක් (45,721*19) වන බවත්, ඒ සම්බන්ධයෙන් 2026 මැයි 21 දිනය තෙක් මුදල් රෙගුලාසි 103(1),104(1) ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.

(ආ) 2026 පෙබරවාරි 11 දින විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පවතින ටැබ් පරිගණක 963ක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණද 2026 මැයි 21 දිනය තෙක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4.3 පාඩු හා හානි**

මූලය ප්‍රකාශනවල ඇතුළත් පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනය - ඇමුණුම ii පිළිබඳ පරීක්ෂාවේදී අනුරාධපුර නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ග්‍රාම නිලධාරීවරයකු වෙත නිකුත් කර තිබූ, අස්ථානගත වී ඇති ටැබ්ලට් පරිගණකයේ අලාභය ලෙස රු.57,151 ක් අයකර ගෙන තිබූ නමුත් අදාල ඇමුණුමෙහි අයකර ගැනීම් ලෙස සටහන් කර ඇත්තේ රු.45,157 ක් පමණක් බව නිරීක්ෂණය විය.

**4.4 කළමනාකරණ දුර්වලතා**

(අ) 2022 මැයි 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සහිතව Sources and Methods for National Accounting System – Sri Lanka නමින් වූ ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීමේ ක්‍රමවේදය දෙපාර්තමේන්තු වෙබ් අඩවියට නිකුත් කර තිබුණි. එහි 6.2.3 ඡේදයට අනුව, වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයට (GDP) සංශෝධන කළ හැකි කාලය (Revision Time) ඉදිරි වර්ෂ දෙකක් (with next two annual releases) ලෙස දක්වා තිබුණි. එසේ වුවද, 2022 මැයි 28 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/0698/504/003 හි 2.5 ඡේදය මගින් යම්කිසි වර්ෂයක ප්‍රකාශයට පත් කරන ලද කාර්තුගත ඇස්තමේන්තු සඳහා එම වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු නිකුත් කරනු ලබන අවස්ථාවේදී පමණක් සංශෝධනයන් කිරීමට 2022 මැයි 30 දින අමාත්‍ය මණ්ඩල එකඟතාවය ලබාගෙන තිබුණි. ඒ් අනුව, ඉදිරි වර්ෂ දෙකක් තුල ජාතික ගිණුම් ඇස්තමේන්තු සඳහා සංශෝධනයන් කිරීමට අමාත්‍ය මණ්ඩල එකඟතාවයක් ලබාගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ භාවිතා කෙරෙන ඇඟිලි සළකුණු යන්ත්‍ර 08ක් සහ Easy Time Office Management මෘදුකාංගයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දින දෙකක් තුල සිදුකළ භෞතික පරීක්ෂාවේදී පැමිණීම පිටවීම සටහන් කෙරෙන අනුක්‍රමික අංක 6218145100040 දරන ඇඟිලි සළකුණු යන්ත්‍රය මෙම වාර්තාවේ දිනය වන විට වසර දෙකකට අධික කාලයක් තුල ක්‍රියා විරහිතව පැවතියද අලුත්වැඩියා කරගැනීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව, කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම සිදුවිය යුතු වුවත්, 2026 මැයි 06 දිනට යාවත්කාලීන කරන ලද දත්ත මුදා හැරීමේ ඉදිරි සටහන (Advance Data Release Calendar) පිළිබඳ පරීක්ෂාවේදී, 2026 වර්ෂයේදී වෙබ් අඩවියට නිකුත් කිරීම ප්‍රමාද වූ අවස්ථා 25ක් සහ මුද්‍රිත ප්‍රකාශන නිකුත් කිරීම් ප්‍රමාදවීම් අවස්ථා 01ක් නිරීක්ෂණය වූ අතර ප්‍රමාද කාලය මාස 01 - 12ත් අතර විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 1,764න් 589 ක් හෙවත් සියයට 33ක් පුරප්පාඩුව පවතින බවත්, පුරප්පාඩුවලින් සියයට 37ක් තෘතීය මට්ටමේ තනතුරුද, සියයට 28ක් ද්විතිය මට්ටමේ තනතුරු සහ සියයට 26 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුද වන බවත් නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය තුල කාර්යය මණ්ඩල බඳවා ගැනීම් සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොමැති බව ද නිරීක්ෂණය විය.



එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වාර්ෂිකව ආයතනයේ අපේක්ෂිත නිමැවුම හා එහි ප්‍රගතිය මැනිය හැකි කාර්ය සාධන දර්ශක තුනක් හඳුනාගෙන ඇත. පසුගිය වසරට අදාලව එම දර්ශකවල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | දළ දේශීය නිෂ්පාදිතය (GDP) ඇතුළු සාර්ව ආර්ථික දර්ශක දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත් කිරීම | 100 | | |
| 2 | ශ්‍රම වෙළඳපල දර්ශක (රැකියා නියුක්තිය හා රැකියා වියුක්තිය) විශේෂ දත්ත ප්‍රකාශයට පත්කිරීමේ සම්මතයන්ට අනුව ප්‍රකාශයට පත් කිරීම | 100 | | |
| 3 | ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම | 100 | | |

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශය මඟින් පසුගිය වසර තුල සිදු කරන ලද කාර්යයන් මත පදනම්ව ගණනය කරන ලද කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පහත දක්වා ඇත.

| 01 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | ගණන් ගැනීමේ (Enumeration) අදියරේ ගෙවීම් සිදු කිරීම | 99.5 | | |
| 2 | දත්ත ගොනුව සකස් කිරීම (Provisional) | 100 | | |
| 3 | මූලික (Preliminary) වාර්තාව සකස් කර එළිදැක්වීම | 100 | | |
| 4 | නිර්දේශිත ක්‍රමවේදයන් අනුව දත්ත සැකසීම (Data processing) | 100 | | |
| 5 | වාර්තා ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම | 100 | | |
| 6 | දිස්ත්‍රික්ක කාර්ය මණ්ඩලය සමඟ දත්ත වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම | 100 | | |
| 7 | අවසන් වගු (Final Tabulations) සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කිරීම | 98 | | |

| | | | | |
|---|---|---|---|---|
| 8 | දිස්ත්‍රික්ක මට්ටමේ මූලික (Preliminary) වාර්තා සකස් කිරීම<br>i) මූලික ජනගහන තොරතුරු<br>ii) මූලික නිවාස තොරතුරු | 100 | | |
| 9 | වැඩමුළුව (Key findings workshop) | 100 | | |
| 10 | අවසන් වාර්තාව (Final Report) සකස් කර එළි දැක්වීම | 90* | | |
| 11 | සංගණන කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් සහ දිස්ත්‍රික්ක කාර්ය මණ්ඩලය සඳහා දත්ත ප්‍රචාරණ වැඩමුළු පැවැත්වීම | | | 60** |
| 12 | රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ දේශපාලන අධිකාරිය සඳහා දත්ත ප්‍රචාරණ වැඩමුළු පැවැත්වීම | | | 65** |
| 13 | තෝරාගත් තේමා යටතේ වාර්තා සකස් කිරීම (පූර්ව සූදානම් කටයුතු) | 90 | | |
| 14 | සිතියම් හරහා දත්ත ප්‍රචාරය කිරීම (Thematic maps) | 100 | | |
| 15 | ඩිජිටල් දත්ත පුවරුව (Dashboard) හරහා දත්ත ප්‍රචාරය කිරීම | | | 60*** |
| 16 | ජනගහන ප්‍රක්ෂේපණය (Population projection) සකස් කිරීම සඳහා වන මූලික කටයුතු සිදු කිරීම | 100 | | |
| 17 | ජාතික සහ ජාත්‍යන්තර දත්ත ඉල්ලීම් සඳහා දත්ත ලබාදීම | 100 | | |
| 18 | සංගණන වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වාගෙන යාම | 100 | | |
| 19 | 5% දත්ත ගොනුව (5% data file) සහ Metadata සකස් කිරීම | | 70**** | |

* අවසන් වාර්තාවට අදාලව අවසන් දත්ත ගොනුව සකස් කර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පුද්ගල තොරතුරු හා නිවාස තොරතුරු පිළිබඳ දත්ත වගු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී. එමෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ ආපදා තත්වයට අදාලව ඉල්ලුම් කරන ලද හදිසි දත්ත අවශ්‍යතා සඳහා ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ ජනගහන හා නිවාස දත්ත වහාම ලබා දෙන ලදී. මේ සඳහා දත්ත සැපයීම ප්‍රමුඛතාවක් ලෙස සැලකූ අතර, පවතින තත්වය හේතුවෙන් 2025 හතරවන කාර්තුවේ නිකුත් කිරීමට නියමිත ව තිබූ අවසන් වාර්තාව නිකුත් කිරීම 2026 වර්ෂයේ පළමු කාර්තුවට කල් දැමීමට සිදු විය.

** අවසන් වාර්තාවට අදාලව සකස් කරන ලද දත්ත පිළිබඳව සියළුම දිස්ත්‍රික් අංශ ප්‍රධානීන් මඟින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය දැනුවත් කරන ලදී. 2024 සංගණනයේ අතිශය වැදගත් තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දෙන ලදී. තවද, ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කළ ඉල්ලීම් අනුව, සංගණන ප්‍රතිඵල පිළිබඳව දැනුවත් කිරීම් අදාල අවශ්‍යතාවයන් අනුව (briefing meetings) දේශපාලන අධිකාරිය හා එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා පවත්වන ලදී. 2025 හතරවන කාර්තුව තුළ දිස්ත්‍රික් පරිපාලනයට අදාල නිලධාරීන් සඳහා කොළඹ දී 2024 සංගණන දත්ත පිළිබඳ දැනුවත් කිරීමට සැලසුම් කර තිබුනද, "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වූ ආපදා තත්ත්වය හේතුවෙන්, කොළඹට මෙම නිලධාරීන් එකතු කරගැනීම සිදු කළ නොහැකි විය. එබැවින්, එම කාර්යය 2026 වර්ෂයේ පළමු කාර්තුවට කල් දැමීමට සිදු විය. එසේම, 2026.03.20 දින - ජන හා නිවාස සංගණනයේ අවසන් වාර්තාව පළකරන ලද අතර, එය 2026.04.06 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගන්වන ලදී. 2026.04.10 දින අවසන් වාර්තාවේ අඩංගු කරුණු එළිදැක්වීම හා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන සිදු කරන ලදී.

*** ඩිජිටල් දත්ත පුවරුව (Dashboard) හරහා දත්ත ප්‍රචාරය කිරීම අවසන් වාර්තාවත් සමගම සිදු කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව, 2026.04.10 දින අවසන් වාර්තාවේ අඩංගු කරුණු එළිදැක්වීම හා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනේදී මෙම දත්ත පුවරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

**** අවසන් වාර්තාව නිකුත් කිරීමෙන් පසු 5% දත්ත ගොනුව සකස්කර අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.

| **02 අංශය** | | | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)** | **අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම** | | |
| | | **100%-90%** | **89% - 75%** | **74% - 50%** |
| 1 | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය-2024 | 90 | | |
| 2 | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය -2025 | 100 | | |
| 3 | වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය -2025 | 100 | | |
| 4 | මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය | 100 | | |
| 5 | ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය | 100 | | |
| 6 | ව්‍යාපාර නාමාවලිය (SBR) | 100 | | |
| 7 | පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය | 100 | | |
| 8 | කර්මාන්ත නිෂ්පාදන දර්ශකය පදනම් වර්ෂය වෙනස් කිරීම | 100 | | |
| 9 | ආර්ථික සංගණනය (කෘෂිකාර්මික නොවන) | 100 | | |

| 03 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - (මහ කන්නය- 2024/25) | 100 | | |
| 2 | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - (යල කන්නය- 2025) | 95 | | |
| 3 | ආර්ථික සංගණනය -2025/26 (කෘෂිකාර්මික කටයුතු) | | | 65 |
| 4 | ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම මහ කන්නය - 2024/25 | 100 | | |
| 5 | ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම යල කන්නය - 2025 | | 85 | |
| 6 | අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2025 | | | 65 |
| 7 | ලොකු ළූණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2025 | 100 | | |
| 8 | තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය - 2024/25 | 100 | | |
| 9 | තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය - 2025/26 | 100 | | |
| 10 | පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම - 2025 | 100 | | |
| 11 | ආහාර ශේෂ පත්‍රය - 2024 | 100 | | |

| 04 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | ජාතික ගිණුම් වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම, දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට නිකුත් කිරීම - 2024 | 100 | | |
| 2 | ජාතික ගිණුම් වැඩි දියුණු කිරීම සඳහා පවරා ඇති ක්‍රියාකාරකම් සිදුකිරීම | 100 | | |
| 3 | 2024 හතරවන කාර්තුව සහ වාර්ෂික ජාතික ගිණුම් පිළියෙළ කිරීම | 100 | | |
| 4 | 2025 පළමු කාර්තුව සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම | 100 | | |
| 5 | 2025 දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් පිළියෙළ කිරීම | 100 | | |
| 6 | 2025 තෙවන කාර්තුව සඳහා ජාතිකගිණුම් පිළියෙළ කිරීම | 100 | | |
| 7 | UN Year Book -2024 සඳහා දත්ත සැපයීම | 100 | | |
| 8 | දේශිය හා ජාත්‍යාන්තර ආයතනවල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම | 100 | | |

| 05 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | සංඛ්‍යාන නිබන්ධනය -2025 | 95 | | |
| 2 | සංඛ්‍යාන අත්පොත - 2025 ( ඉංග්‍රීසි) | 100 | | |
| 3 | සංඛ්‍යාන අත්පොත - 2025 (සිංහල/දෙමළ) | 100 | | |
| 4 | සංඛ්‍යාන දත්ත පත්‍රිකාව - 2025 | 100 | | |
| 5 | 5.1 ශ්‍රී ලංකාවේ ආර්ථික සංඛ්‍යාති - 2025 (සිංහල ) | 100 | | |
| | 5.2 ශ්‍රී ලංකාවේ ආර්ථික සංඛ්‍යාති - 2025 ( දෙමළ) | 100 | | |
| | 5.3 ශ්‍රී ලංකාවේ ආර්ථික සංඛ්‍යාති - 2025 (ඉංග්‍රීසි) ) | 100 | | |
| 6 | පුවත් විවරණිකාව -1 වන වෙළුම 2025 | 100 | | |
| 7 | පුවත් විවරණිකාව - 2 වන වෙළුම 2025 | 100 | | |
| 8 | වාර්ෂික කාර්ය සාධන වාර්තාව -2024 | 100 | | |
| 9 | 9.1 ක්‍රියාකාරී සැලැස්ම- 2025 | 100 | | |
| | 9.2 ක්‍රියාකාරී සැලැස්ම -2025 පළමු සංශෝධනය | 100 | | |
| | 9.3 ක්‍රියාකාරී සැලැස්ම 2026 | 100 | | |
| 10 | පළාත් පාලන සංඛ්‍යාලේඛන- 2024 | 100 | | |
| 11 | ගොඩනැගිලි සංඛ්‍යාලේඛන- 2024/2025 | 100 | | |
| 12 | දුරකථන නාමාවලි යෙදවුම යාවත්කාලීන කිරීම | 100 | | |
| 13 | දෙපාර්තමේන්තු ප්‍රකාශන බෙදාහැරීම | 100 | | |

| 06 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | පොත් බැඳීම් කටයුතු | 100 | | |
| 2 | දෙපාර්තමේන්තු ප්‍රකාශන වල මෘදු පිටපත් පුස්තකාල දත්ත පදනමට ඇතුලත් කිරීම | | | 40* |
| 3 | පුස්තකාල ස්වයංක්‍රීයකරණ දත්ත සමුදා පද්ධතිය (KOHA) පවත්වාගෙන යාම | | | 40** |
| 4 | දෙපාර්තමේන්තු විෂය පථයට අදාල ලිපි ඩිජිටල් පුස්තකාල දත්ත පද්ධතියට ඇතුලත් කිරීම | | | 50*** |
| 5 | පුස්තකාල පොත් මිලදී ගැනීම | | | 36**** |
| 6 | පොත් බැහැරදීමේ කටයුතු සිදුකිරීම | 100 | | |
| 7 | දත්ත පද්ධතිය හා පුස්තකාල සේවා පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | | | 0***** |

* Server පද්ධතිය 2025 ජුලි මස සිට ක්‍රියාවිරහිත වීම හේතුවෙන් Digital Repository මෘදුකාංගය අක්‍රිය වී ඇත.

** KOHA Database හි Server පද්ධතිය 2025 ජුනි මස සිට ක්‍රියාවිරහිත වීම හේතුවෙන් නව Server එකක් මිලදී ගැනීමට 2026 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කොට ඇත.

*** Server පද්ධතිය 2025 ජුලි මස සිට ක්‍රියාවිරහිත වීම හේතුවෙන් Digital Repository මෘදුකාංගය අක්‍රිය වී ඇත.

**** මෙම වසරට වෙන්කළ මුදලින් 36% පොත් මිලදී ගත් අතර ඉතිරි මුදල සඳහා පොත් මිලදී ගැනීමට පොත් ලැයිස්තු සකසා ප්‍රසම්පාදන අංශයට ඉදිරිපත් කර ඇත.

***** Digital Repository සහ KOHA Database හි Server එක අක්‍රිය වීම හේතුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට නොහැකි වී ඇත.

| 07 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | නිෂ්පාදකයාගේ මිල එකතු කිරීමේ සමීක්ෂණය (LPAP) - දත්ත ඇතුළත් කිරීමේ වැඩසටහන - 2025 (CAPI- පරිගණක ආශ්‍රිත පුද්ගලික සම්මුඛ පරීක්ෂණ) | 100 | | |
| 2 | දිස්ත්‍රික් නාගරික මිල එකතු කිරීමේ සමීක්ෂණය | 100 | | |
| 3 | ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - 2025 CAPI වැඩසටහන සැකසීම | 100 | | |
| 4 | CPH 2024 සංගණන දත්ත සැකසීමේ කාර්යය | 100 | | |
| 5 | MRCB (Master Registry of Census Blocks) (සංගණන වාරණ පිළිබඳ ප්‍රධාන ලේඛනය) දත්ත සමුදාය නඩත්තු කිරීම | 100 | | |
| 6 | ගෘහඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය (HIES) - CAPI මෘදුකාංග වැඩිදියුණු කිරීම් | 100 | | |
| 7 | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - දත්ත ඇතුළත් කිරීමේ වැඩසටහන් සංවර්ධනය | 100 | | |
| 8 | කෘෂිකර්ම සංගණනය 2025 - දත්ත එකතු කිරීමේ CAPI මෘදුකාංග වැඩසටහන සකස් කිරීම | 90 | | |
| 9 | KOHA Library System - නඩත්තු කිරීමේ කටයුතු සහ උපස්ථ ලබා ගැනීම | | 75 | |
| 10 | 2024 දිස්ත්‍රික් අත්පොත සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම | 100 | | |
| 11 | DCS ප්‍රධාන වෙබ් අඩවියට GDP තොරතුරු උඩුගත කිරීම | 100 | | |
| 12 | DCS ප්‍රධාන වෙබ් අඩවියට මාසික කර්මාන්ත නිෂ්පාදන දර්ශකය උද්ධමනය සහ මිල දර්ශක උඩුගත කිරීම | 100 | | |
| 13 | SDG වෙබ් අඩවි නඩත්තුව | 100 | | |
| 14 | නව DCS ප්‍රධාන වෙබ් අඩවිය - මෙහෙයුම් කටයුතු සහ නඩත්තුව | 100 | | |
| 15 | සර්වර් ඒකකය වැඩිදියුණු කිරීම | 100 | | |
| 16 | පරිගණක ජාලය සහ ඒ සම්බන්ධ සයිබර් ආරක්ෂාව වැඩි දියුණු කිරීම | 100 | | |
| 17 | පරිගණක නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම | 100 | | |
| 18 | පූර්ව ගණන් ගැනීමේ සමීක්ෂණයේ තොරතුරු හා තාක්ෂණ කටයුතු | 100 | | |

| 08 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | 2024 වර්ෂයට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම | 100 | | |
| 2 | තනතුරු ස්ථිර කිරීම | 100 | | |
| 3 | පරිවාස කාලය දීර්ඝ කිරීම | 100 | | |
| 4 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම | 100 | | |
| 5 | වාර්ෂික වැටුප් වර්ධක නියෝග නිකුත් කිරීම | 100 | | |
| 6 | වාර්ෂික කාර්ය සාධන ඇගයීම | 100 | | |
| 7 | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | 100 | | |
| 8 | විශ්‍රාම ගැන්වීම | 100 | | |
| 9 | නඩත්තු ගිවිසුම් අලුත් කිරීම | 95 | | |
| 10 | වාහන සේවා කිරීම | 100 | | |
| 11 | ඉන්ධන පරිභෝජන පරීක්ෂණ | 90 | | |

| 09 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය 2024 ,2025 | 100 | | |
| 2 | ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය 2025 | 100 | | |
| 3 | දත්ත නිකුත් කිරීම | 100 | | |
| 4 | ශ්‍රම සංඛ්‍යාලේඛනඥවරුන්ගේ ජාත්‍යන්තර සමුළුවේ 19,20 හා 21 වන යෝජනා 2026 ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණයට අනුගත කිරීම පිළිබඳ පූර්ව පරීක්ෂාව | 100 | | |
| 5 | ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය -2023 | 100 | | |
| 6 | දේශීය සංචාරක වියදම් සමීක්ෂණය- 2025/26 | | | 20* |
| 7 | STEP සමීක්ෂණය-2026 | 100 | | |
| *මෙහි CAPI වැඩසටහන සැකසීම සංචාරක අමාත්‍යාංශය විසින් සිදු කිරීමට භාරගත් නමුත් පසුව එය අප දෙපාර්තමේන්තුවටම භාර දෙන ලද අතර දැනට එය සිදුකෙරෙමින් පවතී.එබැවින් එහි ප්‍රගතිය 20% දක්වා අඩු විය. | | | | |

| 10 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් සිදු කරන සංගණන හා සමීක්ෂණ වල ප්‍රකාශන, ආකෘති පත්‍ර මුද්‍රණය | 100 | | |

| 11 අංශය | | | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)** | **අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම** | | |
| | | **100%-90%** | **89% - 75%** | **74% - 50%** |
| 1 | දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික හා පරිපාලනමය පහසුකම් සැපයීම | 100 | | |
| 2 | දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික වැඩමුළු පැවැත්වීම | | | 60* |
| 3 | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම | | 90 | |
| 4 | කාර්යසාධනය සහ ප්‍රගතිය නිරීක්ෂණය සාකච්ඡා කිරීම සඳහා කමිටු රැස්වීම පැවැත්වීම (ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත, කෘෂිකර්ම) | | | 60** |
| 5 | අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු වල ඇති සංඛ්‍යාලේඛන අංශ සම්බන්ධීකරණය සහ ඇගයීම | 100 | | |

* දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ පළමු වැඩමුළුව 2025 මැයි 29 හා 30 දිනවලදී දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. එක් තේමාවක් යටතේ ගැටළු හා යෝජනා සඳහා විසඳුම් ලබා දීම අරමුණු කරගෙන දෙවන වැඩමුළුව පැවැත්වීමට සැලසුම් කළද බොහෝ ප්‍රදේශවලට ඇතිවූ හදිසි ආපදා තත්ත්වය සහ කෘෂිකර්ම සංගණනය 2025 පුහුණු වැඩමුළු රාජකාරි නිසා අංශ ප්‍රධානීන් එකවර සම්බන්ධ කර ගැනීමේ ගැටළු ඇති වූ බැවින් පැවැත්වීමට නොහැකි විය.

** කර්මාන්ත, ප්‍රජාවිද්‍යාත්මක හා කෘෂිකර්ම කමිටු රැස්වීම් 2025 ජුනි 17,18,19 දිනවල ප්‍රධාන කාර්යාලයීය පුහුණු අංශයේදී පැවැත්විණි. දෙවන කමිටු රැස්වීම් වර්ෂාවසානයේ Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට සැලසුම් කළද බොහෝ ප්‍රදේශවලට ඇතිවූ හදිසි ආපදා තත්ත්වය සහ කෘෂිකර්ම සංගණනය 2025 පුහුණු වැඩමුළු රාජකාරි නිසා නිලධාරීන් සියලු දෙනා එකවර සම්බන්ධ කර ගැනීමේ ගැටළු ඇති වූ බැවින් පැවැත්වීමට නොහැකි විය.

| 12 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | **100%-90%** | **89% - 75%** | **74% - 50%** |
| 1 | දෙපාර්තමේන්තුවේ ආචාර්ය උපාධි/පශ්චාත් උපාධි හදාරන්නන් සඳහා ප්‍රතිපාදන ලබාදීම | 100 | | |
| 2 | සංඛ්‍යාන කාර්ය මණ්ඩලයේ වෘත්තිය කුසලතා හා මෘදු කුසලතා සංවර්ධන සඳහා දෙපාර්තමේන්තුව තුළ හා පිටත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම | 100 | | |
| 3 | දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතු නිලධාරීන් සඳහා සිංහල/දෙමළ භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 100 | | |
| 4 | දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 100 | | |
| 5 | දෙපාර්තමේන්තුවේ සහායක කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තුව තුල හා පිටත කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම (කළමණාකරන සහකාර, මුද්‍රණ අංශ නිලධාරීන්, රියදුරු, කාර්යාල සහායක) | 100 | | |
| 6 | පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරීන්, පොදු මහජනතාව අතර සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 100 | | |

| 15 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2024 වෙනුවෙන් සම්පූර්ණ කර එක්රැස් කරන ලද ප්‍රශ්නාවලින්ගෙන් කොටසකට අදාළව දත්ත සැකසුම් සිදුකිරීම. | 133* | | |
| 2 | ජන හා නිවාස සංගණනය - 2024 මගින් එක්රැස් කරන ලද දත්ත ප්‍රජාවිද්‍යාත්මක ක්‍රමවේද භාවිතයෙන් ඇගයීමට ලක් කිරීම. | 100 | | |
| 3 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ජර්නලය වන ශ්‍රී ලංකා සංඛ්‍යානමය විමසුම (Sri Lanka Statistical Review (SSR)) ප්‍රකාශයට පත් කිරීම. | 100 | | |
| 4 | ශ්‍රී ලංකාවේ ළමුන් සම්බන්ධ සංඛ්‍යාති ප්‍රකාශයට පත් කිරීම සඳහා සකස් කර ඇති වෙබ් පිටුව යාවත්කාලීන කිරීම. | 100 | | |
| 5 | ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ සංඛ්‍යාති ප්‍රකාශයට පත් කිරීම සඳහා සකස් කර ඇති වෙබ් පිටුව යාවත්කාලීන කිරීම. | 100 | | |
| 6 | වෙනත් රාජ්‍ය ආයතන මගින් සිදු කරනු ලබන ඉල්ලීම් අනුව අවශ්‍ය පරිදි තාක්ෂණික සහය ලබාදීම. | 100 | | |
| 7 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීමේ ඉදිරි දින සටහන පවත්වාගෙන යාම. | 100 | | |
| 8 | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2024 හි මූලික වාර්තාව සිංහල සහ දෙමළ භාෂාවෙන් සකස් කිරීම | 100 | | |

*සේවා නියුක්තිකයින් 400,000 කට අදාළ දත්ත සංස්කරණය හා සකස් කිරීම මෙම වසර තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණ ද, මෙම කාර්යය සඳහා සීමාවාසික පුහුණුවන්නන් ද (විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂක) යොදා ගැනීමට හැකිවූ බැවින් අපේක්ෂිත ඉලක්කය ඉක්මවා දත්ත සංස්කරණය හා සකස් කිරීම සිදු කළ හැකි විය. එම නිසා භෞතික ඉලක්කය 133% විය.

| 16 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 01 | මිල දර්ශක සකස් කිරීම සඳහා පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය | 100 | | |
| 02 | ජාතික පාරිභෝගික මිල දර්ශකය සකස් කිරීම සඳහා දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන | 100 | | |
| 03 | නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) ට සේවා අංශය එකතු කිරීම | 100 | | |
| 04 | නිෂ්පාදන, කෘෂි කර්මාන්ත හා උපයෝගිතා අංශ වල මිල ගණන් රැස් කිරීමේ වැඩ සටහන | 100 | | |
| 05 | මාසිකව ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) ගණනය කිරීම (පාද වර්ෂය : 2021 = 100) | 100 | | |
| 06 | මාසිකව කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) ගණනය කිරීම (පාද වර්ෂය : 2021 = 100) | 100 | | |
| 07 | මාසිකව නිෂ්පාදන, කෘෂි කර්මාන්ත හා උපයෝගීතා අංශ සඳහා නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) ගණනය කිරීම (පාද වර්ෂය : 2018, Q4 = 100) | 100 | | |
| 08 | මිල දත්ත බෙදා හැරීම - සිල්ලර මිල තොරතුරු හා නිෂ්පාදකයාගේ මිල තොරතුරු ඇතුළත් විවර්ණිකාව 2021 - 2024 | 100 | | |
| 09 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ සහ අනෙකුත් තරාතිරම් වල හමුදා නිලධාරීන්ගේ සලාක වටිනාකම මාසිකව ගණනය කිරීම | 100 | | |
| 10 | ආසියා පැසිපික් කළාපයේ ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන (ICP) - 2024 | 100 | | |

| 18 අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | සංගණන කාණ්ඩ මායිම් යාවත්කාලීන කිරීම සහ ස්ථානීය පිහිටීම් ලක්ෂ තහවුරු කිරීම:<br>නිවැරදි භූගෝලීය පිහිටීම නියෝජනය කිරීම සඳහා සංගණන කාණ්ඩ මායිම නිරවද්‍ය කිරීම සහ ජන සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියරේදී ලබා ගන්නා ලද ස්ථානීය පිහිටීම් ලක්ෂ දෘඩ සිතියම ද පරීක්ෂා කරමින් තහවුරු කිරීම (සමස්ත දත්ත ප්‍රමාණයෙන් 50% පමණ) | 100 | | |
| 2 | යාවත්කාලීන කරන ලද සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ භූඅවකාශයීය දත්ත පද්ධතිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හා සැසඳීම | 100 | | |
| 3 | වෙනත් පරිපාලන කොට්ඨාස මායිම් භාවිත කරන ආයතනවල මායිම් අවකාශයීය දත්ත පද්ධතිය තුළට ඇතුළත් කිරීම | 100 | | |
| | 3.1 අධ්‍යාපන අමාත්‍යාංශය | 100 | | |
| | 3.2 කෘෂිකර්ම අමාත්‍යාංශය | 100 | | |
| | 3.3 අධිකරණ අමාත්‍යාංශය | 100 | | |
| 4 | දෙපාර්තමේන්තු අවකාශයීය දත්ත පද්ධතිය තුළට ඇතුළත් කරන ලද වෙනත් පරිපාලන කොට්ඨාස මායිම් යාවත්කාලීන කිරීම | 100 | | |
| | 4.1 පොලිස් දෙපාර්තමේන්තුව | 100 | | |
| | 4.2 අධ්‍යාපන අමාත්‍යාංශය | 100 | | |
| | 4.3 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 100 | | |
| 5 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ප්‍රවේශ පහසුකම් සහිතව අවකාශයීය දත්ත පද්ධතිය දියුණු කිරීම | 100 | | |
| 6 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ග්‍රාම නිලධාරී කොට්ඨාස සම්බන්ධ වාර්තාවක් සැපයීම | 100 | | |
| 7 | අවබෝධතා ගිවිසුම් හරහා රජයේ ආයතන වෙත භූ අවකාශ දත්ත නිකුත් කිරීම | 100 | | |
| 8 | තේමා සිතියම් නිර්මාණය කිරීම | 100 | | |

| තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඒකකය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක මත දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම | | | | |
| 1 | a) ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම | 100 | | |
| 2 | b) වෙනත් ආයතන විසින් සම්පාදනය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක හෝ ප්‍රොක්සි ආදේශක (Proxy) දර්ශක වලංගුකරණය | 100 | | |
| 3 | c) ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූලව තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක හෝ ආදේශක (Proxy) දර්ශක සම්පාදනය කිරීම සඳහා තිරසර සංවර්ධන සභාව සහ අනෙකුත් නියෝජිතායතනවලට තාක්ෂණික සහාය ලබා දීම | 100 | | |
| 4 | 2. තිරසර සංවර්ධන සභාව විසින් සංවිධානය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ ආශ්‍රිත රැස්වීම් සහ වැඩමුළුවලට සහභාගී වීම | 100 | | |
| 5 | 3.ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක ඇතුළත් දත්ත පත්‍රිකාවක් සකස් කිරීම සහ ප්‍රකාශනය කිරීම | 98 | | |
| 6 | 4. ඇතැම් දර්ශක සහ සංඛ්‍යාලේඛන ජාත්‍යන්තර වාර්තාකරණය | 100 | | |
| | 5. SDG 16 සහ SDG 11 යටතේ දර්ශක සම්පාදනය කිරීම සඳහා සමීක්ෂණයක් සැලසුම් කිරීම සහ පැවැත්වීම (2025/2026) | | | |
| 7 | a) ක්‍රියාකාරී සැලැස්ම, පිරිවැය ඇස්තමේන්තු, ක්ෂේත්‍ර සැලැස්ම, ප්‍රශ්නාවලිය, පරිගණක වැඩසටහන් නිර්මාණය, උපදෙස් අත්පොත් සකස් කිරීම, නියැදි ක්‍රමවේදය නිර්මාණය, නියැදි තේරීමේ ක්‍රියාකාරකම්, නියැදි යාවත්කාලීන කිරීම සහ සිතියම්ගත කිරීම, වගු සැලසුම් සකස් කිරීම යනාදී සියලුම සැලසුම් ක්‍රියාකාරකම් | | 75* | |
| 8 | (b) පූර්ව සමීක්ෂණය හා නියමු සමීක්ෂණය | | | 0* |
| * මෙම සමීක්ෂණය පැවැත්වීම සඳහා අනුමැතිය ලැබී නැත. | | | | |

| දත්ත නිකුත් කිරීමේ ඒකකය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | **100%-90%** | **89% - 75%** | **74% - 50%** |
| 1 | ක්ෂුද්‍ර දත්ත ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම | 100 | | |
| 2 | වෙනත් ආයතන/පුද්ගලයින් විසින් කරනු ලබන අනෙකුත් දත්ත ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම | 100 | | |
| 3 | තොරතුරු දැනගැනීමේ පනතට අනුව ලැබෙන තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම | 100 | | |
| 4 | දෙපාර්තමේන්තු මුද්‍රිත ප්‍රකාශනයන් දත්ත භාවිත කරන්නන්ට හා පර්යේෂකයන්ට අලෙවි කිරීම | 100 | | |
| 5 | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ, පාර්ලිමේන්තු කමිටු, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් ඉල්ලීම් කරනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා ප්‍රතිචාර දැක්වීම | 100 | | |

| සංඛ්‍යාන සංවර්ධන සහ ජාත්‍යන්තර සහයෝගීතා ඒකකය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | **100%-90%** | **89% - 75%** | **74% - 50%** |
| 1 | සංඛ්‍යාලේඛන සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා උපායමාර්ගය සකස් කිරීම | 90 | | |

| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - ජීව සංඛ්‍යාලේඛන අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීම - 2025 | 100 | | |
| 2 | උපත්, විවාහ සහ මරණ සංඛ්‍යාව ගණනය කිරීම - 2024 | 95 | | |
| 3 | දත්ත භාවිතා කරන්නන්ට අවශ්‍ය දත්ත ලබා දීම- 2025 | 100 | | |

| කම්කරු සංඛ්‍යාලේඛන අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | "කම්කරු සංඛ්‍යාති 2024" වාර්ෂික වාර්තාව සකස් කිරිම | 100 | | |
| 2 | 2.1 පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය -2023 වාර්තාව සකස් කිරීම | 100 | | |
| | 2.2 වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය -2025 පැවැත්වීම | 90 | | |
| | 2.3 ශ්‍රම ඉල්ලුම පිළිබඳ විවරණිකාව - 2024 සකස් කිරීම | 100 | | |
| | 2.4 ශ්‍රම ඉල්ලුම පිළිබඳ විවරණිකාව - 2025 සකස් කිරීම | 100 | | |
| | 2.5 පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2024 වාර්තාව සකස් කිරීම | 90 | | |
| 3 | ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය- 2025 (බස්නාහිර පළාතේ වතු අංශය) | 100 | | |
| 4 | 4.1ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වාර්ෂික වාර්තාව සඳහා දත්ත ලබාදීම | 100 | | |
| | 4.2 අවම වැටුප් අනුපාත දර්ශකය සකස් කිරීම | 100 | | |
| | 4.3 සංඛ්‍යාන නිබන්ධනය සඳහා දත්ත ලබාදීම | 100 | | |
| 5 | ශ්‍රම වෙළඳ පොළ පිළිබඳ දර්ශකාංක -2024 සකස් කිරීම | 100 | | |

| ධීවර අමාත්‍යංශය -සංඛ්‍යාලේඛන අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | 100%-90% | 89% - 75% | 74% - 50% |
| 1 | වෙරළ කලාප සහ ගැඹුරුදිය මත්ස්‍ය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම | 100 | | |
| 2 | මිරිදිය සහ ජල ජීවී වගා නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම | 100 | | |
| 3 | මත්ස්‍ය සහ කරවල තොග මිල ගණන් සහ පාරිභෝගික මිල ගණන් සැකසීම | 100 | | |
| 4 | මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයන හා අපනයන දත්ත සැකසීම | 100 | | |
| 5 | වාර්ෂික ධීවර සංඛ්‍යාලේඛන ප්‍රකාශනය - 2024<br>අදාළ වාර්තාව සකස් කර අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කර ඇත | 100 | | |
| 6 | දත්ත ලබා දීම<br>I. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (කෘෂිකර්ම දත්ත, ආහාර ශේෂ පත්‍රය, සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත, ජාතික ගිණුම්)<br>II. ශ්‍රී ලංකා මහ බැංකුව<br>III. ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOTC)<br>IV. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) | <br>100<br><br><br><br>100<br>100<br>95 | | |
| 7 | අයිස් යන්ත්‍රාගාර සහ ශීතාගාර පිළිබඳ සමීක්ෂණය 2024/2025<br>මූලික තොරතුරු රැස්කරඇත. 2023/2024 සමීක්ෂණ රාමුව යාවත්කාලීන කර ඇත | 90 | | |
| 8 | ටින් මාළු පිළිබඳ සමීක්ෂණය 2024<br>දේශීය ටින් මාළු නිෂ්පාදනය සම්බන්ධ තොරතුරු අදාළ දේශීය නිෂ්පාදකයින් වෙතින් රැස් කර ඇත. ටින් මාලු වෙළඳපොළ මිල ගණන් පිළිබඳ තොරතුරු වෙළඳපොළ සමීක්ෂණයක් හරහා රැස් කර අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා ලබා දී ඇත | 100 | | |
| 9 | වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම සඳහා වන දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ධීවර දෙපාර්තමේන්තුව සහ නාරා ආයතනය සමඟ ඒකාබද්ධව වැඩිදියුණු කිරීම<br>දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් 2024 වසර සඳහා සැලසුම් කරන ලද කාර්යයන් සපුරාලීම සඳහා අවශ්‍ය තාක්‍ෂණික සහයෝගය ලබා දී ඇත (දත්ත රැස්කරන නිලධාරින් පුහුණු කිරීම, තොටුපළ ලැයිස්තුව යාවත්කාලීන කිරීම, නියැදි සැලැස්ම සැකසීම, දත්ත ඇතුළත් කරනු ලබන මෙහෙයුම වැඩි දියුණු කිරීම සඳහා සංශෝධන යෝජනා කිරීම ආදිය) | 100 | | |

| | | | | |
|---|---|---|---|---|
| 10 | කරවල නිෂ්පාදනය සම්බන්ධයෙන් දත්ත රැස්කිරීම<br><br>කරවල නිෂ්පාදනය සම්බන්ධයෙන් ක්ෂේත්‍රයෙන් දත්ත එක් රැස්කර නොවැම්බර් මාසය දක්වා මාසික ඇස්තමේන්තු සකස්කර ඇත. | 92 | | |
| 11 | ක්‍රියාකාරී ධීවරයින් සහ ක්‍රියාකාරී ධීවර යාත්‍රා සම්බන්ධයෙන් දත්ත ක්ෂේත්‍රයෙන් රැස්කර පරිගනකගත කර වාර්ෂික ඇස්තමේන්තු සැකසීම සඳහා සූදානම් කර ඇත. | 95 | | |

| සෞඛ්‍ය අමාත්‍යාංශය - සංඛ්‍යාලේඛන අංශය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්) | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
| | | **100%-90%** | **89% - 75%** | **74% - 50%** |
| 1 | සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාස මට්ටමින් 2025 වර්ෂය සඳහා ජනගහන ඇස්තමේන්තු කිරීම | 100 | | |
| 2 | 2025 වර්ෂය සඳහා සෞඛ්‍ය ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීම | 100 | | |
| 3 | පුහුණු වැඩසටහන් පැවැත්වීම - රෝහල් සංඛ්‍යාලේඛන කාර්යයේ නිරත කාර්ය මණ්ඩලය සඳහා රෝහල් සංඛ්‍යාලේඛන හා eIMMR පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් , ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ 9 ක් ආවරණය වන පරිදි පැවැත්වීම<br>* ICD 11 පිළිබඳ මූලික හඳුන්වාදීමේ වැඩසටහනක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ 8ක ක්‍රියාත්මක කිරීම.<br>*දත්තවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ 9 ක පැවැත්වීම<br>*ICD 10 කේත කිරීමේ පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම. | 100 | | |
| 4 | වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම - 2024 | 95 | | |
| 5 | දත්ත ඉල්ලීම් සඳහා අදාළ පරිදි දත්ත ලබා දීම | 90 | | |
| 6 | දත්ත කේත කිරීම/නිවැරදිතාව පරීක්ෂා කිරීම/ දත්ත පරිගණක ගත කිරීම | | 80 | |
| 7 | බස්නාහිර හා වයඹ පළාත් තුල තෝරාගත් රෝහල් සඳහා ශල්‍යාගාර වාර්තා හඳුන්වා දීම. | 100 | | |

# පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාවලියේදී අරමුණු අංක 17 යටතේ ඇති ඉලක්ක 17.18 ලඟා කර ගැනීම සම්බන්ධ සෘජු වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ යටතේ ඇති 17.18.2 සහ 17.18.3 දර්ශක දෙපාර්තමේන්තුව මඟින් වාර්තා කළ යුතු දර්ශකයන් ලෙස හඳුනාගෙන ඇත.

මීට අමතරව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමේ ක්‍රියාවලියේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යභාරය වනුයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ මත පදනම්ව තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය ඉලක්ක වෙත ලඟා වීම මැනබැලීම සඳහා අවශ්‍ය දර්ශක සම්පාදනය කර ලබා දීමයි. ඒ අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ දර්ශක 38 ක් සඳහා දෙපාර්තමේන්තුව මඟින් මේ වනවිට දත්ත සම්පාදනය කර ඇති අතර 2025 වර්ෂයේදී ඒ අතුරින් දර්ශක 11 ක් සඳහා යාවත්කාලීන දත්ත සකස් කිරීමේ කටයුතු සිදුකොට ඇත. එම දර්ශක හා එහි ප්‍රගතිය පහත වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

| ඉලක්ක/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%-49%** | **50%-74%** | **75%-100%** |
| **අරමුණු 05- ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම** | 5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගි වීම තහවුරු කිරීම | 5.5.2 විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය | | | 100 |
| **අරමුණු 08- සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | 8.1 ජාතික තත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම | 8.1.1 ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික වර්ධනය | | | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 8.2 විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුලින් සහ ඉහල වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුලින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම | 8.2.1 සේවා නියුක්ත පුද්ගලයකු සඳහා වන දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | | | 100 |
| | 8.3 ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්වලට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරි ගැන්වීම | 8.3.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය | | | 100 |
| | 8.5 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.2 ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ අබාධිත සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | | | 100 |
| | 8.6 2020 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම | 8.6.1 අධ්‍යාපනය නොලබන, රැකියාවක නියුක්ත නොවන නැතහොත් පුහුණුවක් නොලබන යෞවනයන්ගේ (වයස 15-24) ප්‍රමාණය. | | | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අරමුණු 09- සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම** | 9.2 සියලු දෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම | 9.2.1(a) දළ දේශීය නිෂ්පාදනයේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම් | | | | 100 |
| | | 9.2.1(b) ඒක පුද්ගල නිෂ්පාදන අගය එකතු කිරීම | | | | 100 |
| | | 9.2.2 සමස්ත සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය | | | | 100 |
| | 9.b සංවර්ධනය වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහාය ලබාදීම, එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම | 9.b.1 සමස්ත අගය එකතු කිරීම් වලින් මධ්‍ය හා ඉහළ තාක්ෂණික කර්මාන්ත අගය එකතු කිරීම් අනුපාතය ආවරණය වන ජනගහනයේ අනුපාතය | | | | 100 |
| **අරමුණු 10- රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම** | 10.4 විශේෂයෙන්ම මූල්‍ය, වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති භාවිතයට ගැනීම සහ ප්‍රගතිශීලී ලෙස සමානත්වය ලබා කර ගැනීම | 10.4.1 වැටුප් සහ සමාජ ආරක්ෂණ හුවමාරු වලින් සමන්විත දළ දේශීය නිෂ්පාදනයේ ශ්‍රම පංගුව | | | | 100 |

## 1.තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**ජයග්‍රහණ**

- ජාතික සංඛ්‍යාන නීතිය නවීකරණය කිරීම

